මහත් කරුණාවෙන් හා ප්‍රඥාවෙන් ලොවට දේශනා කරන්නේ දුකින් නිදහස්වීමේ නිදහසේ පණිවුඩයයි. එය ඒ ඒ සත්ත්වයන්ගේ බුද්ධි මට්ටම අනුව තේරුම් ගෙන තමාගේ බුද්ධියේ හා කැපවීමේ පමණට අනුගමනය කොට දුකින් නිදහස්වීමට අවස්ථාව සැලසේ. බුදුරජාණන් වහන්සේ පුරා වසර 45ක් දේශනා කළ සියලු දහම් කරුණු එක ගාථාවක් තුළ අන්තර්ගත කළ හැකි ය. එනම්,

*සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,*

*සචිත්තපරියෝදපදනං ඒතං බුද්ධානසාසනං.* (ධම්මපද)

කිසියම් තැනැත්තකු සද්ධර්මය ශ්‍රවණය ධර්මාවබෝධය ලද පමණට තම කායික හා වාචසික දුසිරිත්වලින් මිදීමට උත්සාහ ගනී. ප්‍රාණඝාතය ආදි කායික දුසිරිත්වලින් මෙන් ම මුසාවාදය ආදි වාචසික දුසිරිත්වලින් ද දුරුවෙයි. ඔහු මෙලෙස ක්‍රියා කරන්නේ හුදෙක් බාහිර සමාජයෙන් පැමිණෙන අපවාද, දඬුවම් ආදියට බියෙන් පමණක් නොව තම සිතෙහි සතුට නැතිවීමට එම ක්‍රියා ඉවහල් වන බැවිනි. නුවණැති තැනැත්තකුගේ ප්‍රධාන ජීවිත අභිලාශය මානසික සුවයයි. තම සිතට පීඩාව අසහනය දුක පසුතැවිල්ල ගෙන දෙන ක්‍රියාවලින් නුවණැති තැනැත්තා හැකිතාක් දුරට වෙන් වෙයි. ඒ අතර තම සිතට සතුට සහනය ගෙන දෙන යහපත් ක්‍රියාවන්හි හැකිතාක් නිරත වේ. ඒ අනුව දාන, සීල, භාවනා ආදි කුසල චේතනා දියුණු වන අයුරින් තම සිත, කය, වචනය නිරතුරුව කළමනාකරණය කර ගනියි. මෙලෙස දානාදී පින්කම් කිරීම තම සිතට ආහාර ලබා දීමක් වශයෙන් ද සිත අලංකාර කිරීමක් වශයෙන් ද බුදුදහමෙහි දක්වා තිබේ (චිත්තාලංකාරං චිත්තපරික්ඛාරං). මෙලෙස දානාදි පින්කම් කරන අතර තම සිත සපුරා දුකින් නිදහස් වන අයුරින් ප්‍රඥාව දියුණු කරලමින් අවිද්‍යාව දුරු කිරීමට නිතර උත්සාහ ගත යුතු ය. ඒ සඳහා පටිච්චසමුප්පාදය මත පදනම් වූ අනිත්‍ය, දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය තේරුම් ගැනීම අවශ්‍ය වේ. මෙම අවබෝධය ලද පමණට අප්‍රමාදීව සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවන්හි නිරත වෙමින් විද්‍යා, විමුක්ති සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ඇත.

## ක්‍රමයෙන් ගැඹුරට දිවෙන දහම් මග

භාග්‍යවතුන් වහන්සේ මෙලොව උපත ලද මනුෂ්‍යයකුගේ ජීවිතයේ හැම අංශයක් ම දියුණු වන අයුරින් අනුශාසනා කළහ. පහාරාද සූත්‍රයෙහි (අං.නි.) දැක්වෙන පරිදි සාගරය වෙරළේ පටන් ක්‍රමයෙන් ගැඹුරට යන්නාක් මෙන් ම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ක්‍රමයෙන් ගැඹුරට විහිදී යයි. එය මුලදී සරලව ආරම්භ වී ක්‍රමයෙන් ලෝකෝත්තර ප්‍රඥාව කරා ම අඛණ්ඩව දිය යන්නකි.

යමකුගේ සාර්ථකත්වය යනු පෞද්ගලික, සාමාජීය සහ ආධ්‍යාත්මික යන අංශ තුනෙන් ම ඇතිවන දියුණුවයි. ඒ අනුව තම පෞද්ගලික ජීවිතය සඵල කර ගැනීමට හොඳ අධ්‍යාපනයක් මෙන් ම නිවැරදි වෘත්තියක් තෝරා ගැනීම අවශ්‍ය වේ. ධාර්මිකත්වයෙහි පිහිටා හැකිතාක් දුරට අධ්‍යාපනයෙන් හා ආර්ථිකයෙන් දියුණු වීම මෙහි ලා අවශ්‍ය වේ. ඒ අතර තම මව්පියන්ට, අඹුදරුවන්ට, ඤාතීන්ට, හිතවතුන්ට මෙන් සාමාජික වශයෙන් සම්බන්ධතා ඇති අන් අයට ද හැකිතාක් තම යුතුකම් මැනැවින් සපුරාලීමට ද අවශ්‍ය කෙරේ. කෙනෙකුගේ ජීවිතයේ වඩාත් වැදගත් අංශය වන්නේ ආධ්‍යාත්මික දියුණුවයි. එනම් තම මානසික සුවය වැඩිදියුණු වන ආකාරයෙන් වැඩපිළිවෙළක නිතර නිරතවීමයි. මෙහි දී කලණ මිතුරු ඇසුරින් හැකිතාක් ධර්ම ශ්‍රවණය කොට ස්වර්ග මාර්ගය හා මෝක්ෂ මාර්ගය සඵල වන අයුරින් තම චින්තනය හා චර්යාව පවත්වා ගත යුතු ය. ඒ අනුව කර්මඵල අවබෝධයෙන් යුතුව නිතර දාන, සීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වෙමින් පිරිසිදු මානසිකත්වයකින් කටයුතු කරමින් තම සසර ගමන දුගතියට නොවැටෙන ලෙස තම සිත පිහිටුවා ගැනීම අවශ්‍ය වේ. මෙලෙස සිදුකරන ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවන්ගෙන් නොනැවතී දුකින් නිදහස්වීමේ නිවැරදි වූත් ප්‍රායෝගික වූත් මාවත තේරුම් ගැනීම ද මෙහි ලා බෙහෙවින් වැදගත් වේ. පුණ්‍ය ක්‍රියාවලින් සිදු වන්නේ අපගේ ඇස, කන ආදි ඉන්ද්‍රියවලට ලක්වන රූප, ශබ්දාදි අරමුණු ප්‍රිය දෑ බවට පත් කරලන වටාපිටාවක් නිර්මාණය කර දීමයි. අද අප ලබා ඇති සුගතිය, දෙමාපියන්, ඤාතීන්, හිතවතුන්, අධ්‍යාපනය, ධනය ආදිය අපට හිමි වූයේ අතීතයේ කරන ලද දානාදි පින්කම්වල ආනිසංස වශයෙනි. මෙම ආනිසංස

ලැබුණ ද ජීවිතයේ අපට පාලනය කළ නොහැකි පැත්තක් ද පවතී. එනම් මහලුබව, ලෙඩවීම, මරණය, ප්‍රිය විප්‍රයෝග, අප්‍රිය සම්ප්‍රයෝග ආදියයි. යමකුගේ ජීවිතයේ සාර්ථකත්වය යනු තමා අතීතයේ ලද පුණ්‍ය ආනිසංස සතුටින් භුක්තිවිඳීම පමණක් නොව ඒ අතර සිදුවන ඉහත සඳහන් ජීවිත අභියෝග හමුවේ නොසැලී සිටීම ද අවශ්‍ය කෙරේ. අපට සම්බුදු උතුමකු අවශ්‍ය වන්නේත් උන්වහන්සේගේ සද්ධර්මය අවශ්‍ය වන්නේත් මෙම දුක් සමුදායෙන් නිදහස්වීම සඳහායි. අප ජීවිතය මැනැවින් සාර්ථක කර ගත්තා ද යන්න තීරණය කෙරෙන්නේ ජරා, මරණාදි දුක්වලින් කෙතෙක් දුරට නිදහස් වූවා ද යන්න මතයි.

ලොව වෙසෙන සියලු සත්ත්වයන්ගේ ඒකායන පැතුම දුකින් නිදහස් වීමයි. සත්ත්වයා සැපතට කැමැති වන්නේත් දුකට අකැමැති කරන්නේ මේ නිසයි (*සුඛකාමා දුක්ඛපටික්කූලා*). විශේෂයෙන් මිනිසා තම දිවිමගෙහි සිදුකරන සෑම කටයුත්තකින් ම අපේක්ෂා කරන්නේ දුකින් නිදහස් ව සැපතට පත්වීමයි. එහෙත් අභාග්‍යය නම් සත්ත්වයා දුකින් නිදහස් වීම සඳහා සිදු කරන දෑ තුළින් ම තව තවත් දුක වෙත ම ළඟා වීමයි. සම්මා දිට්ඨියෙන් තොර ලෝකයා ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් නිදහස් වීම සඳහා සිදු කරන්නේ එබඳු ම ලක්ෂණවලින් යුතු ජීවී, අජීවී දෑ තමා වෙත ළඟා කර ගැනීමයි. අවසානයේ පෙර තිබුණාට ද වඩා දුක් සමුදායක් සහිත ව අතෘප්තිකර ලෙස ජීවිතය නිමා කොට යළිදු සසරට වැටෙයි. මේ බව මැනැවින් පසක් කළ භාග්‍යවතුන් වහන්සේ දුකින් නිදහස් වීමේ සැබෑ මාවත ප්‍රත්‍යක්ෂ කොට ලෝක සත්ත්වයාට ද එම මාවත ලබා දීමට අතිශය කරුණාධ්‍යාශයෙන් කටයුතු කළහ. උන් වහන්සේ ලොවට දේශනා කළ සෑම දහම් පදයකින් ම ප්‍රකාශ වන්නේ දුකින් නිදහස් වීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් ය. ඒ අතර මහාසතිපට්ඨාන සූත්‍රය (දී.නි.) දුකින් පෙළෙන ලෝකයාට මහා ඖෂධයකි. ලෝක සත්ත්වයා අත්විඳින දුකෙහි සැබෑ ස්වභාවය මැනැවින් විවරණය කොට ඒ සඳහා නොවරදින ප්‍රතිකර්මය ධර්මය තුළ අන්තර්ගත ය.

## දුකෙහි හටගැනීම හා එහි නිරෝධය

අප කිසියම් දුකක් හෝ සැපක් භුක්ති විඳින්නේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියයන්ට රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන අරමුණු ස්පර්ශවීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ඇස ආදි ඉන්ද්‍රියවලට රූපාදි ප්‍රිය අරමුණු එළඹි විට අප සතුටු වන අතර අප්‍රිය අරමුණු එළඹි විට අප දුකට පත්වේ. මෙලෙස අප කිසියම් සැපක් හෝ දුකක් විඳී ද එම සැප හෝ දුක විඳින්නේ එහි යථා ස්වභාවය පිළිබඳ වැටහීමක් නොමැතිවයි. ප්‍රිය අරමුණු හේතුවෙන් කිසියම් මානසික සතුටක් විඳින විට අපට සිතෙන්නේ එම බාහිර අරමුණ නිසා තමාට සැප ලැබුණු බවයි. අප්‍රිය අරමුණු නිසා කිසියම් මානසික දුකක් විඳීමේ දී අපට සිතෙන්නේ එම බාහිර අරමුණු නිසා දුක එළඹි බවයි. එහෙත් එහි යථාර්ථය එය නොවේ. කිසියම් ප්‍රිය හෝ අප්‍රිය අරමුණක් නිසා සැප හෝ දුකක් විඳින්නේ එම වින්දනය බාහිර අරමුණෙන් පැමිණීම නිසා නොව තමා ඒ පිළිබඳව සිතන ආකාරය අනුවයි. එම අවස්ථාවෙහි අපගේ සිතෙහි පවත්නා නොදැනීම (අවිද්‍යාව), කර්මය, තෘෂ්ණාව, එහි යථාර්ථය නොදැනීම ආදි කරුණු නිසා දුක හෝ සතුට තමා විසින් ම නිර්මාණය කරනු ලැබේ. එම අද්දැකීම කලින් පැවැතුනක් නොවන අතර එය අනාගතයට යන්නක් ද නොවේ. එම අද්දැකීම වර්තමානයෙහි හටගෙන ඉතිරි නැතිව ම නිරුද්ධ වන ස්වභාවයකි. මෙලෙස අවිද්‍යා සහගතව යම්තාක් අප සැපක් හෝ දුකක් විඳී ද එය අවිද්‍යාව නිසා ගොඩනගා ගත්තක් වන අතර එහි අවසාන ප්‍රතිඵලය තව තවත් දුකට පත්වීමයි.

මේ බව කලණ මිතුරු ඇසුරින් යමෙක් තේරුම් ගත්තේ නම් දුකින් නිදහස්වීමට සඳහා වූ මාවත වෙත ඔහු යොමු වනු ඇත. ඒ අනුව කිසියම් අද්දැකීමක් ලැබීමේ දී සිදුවන යථාර්ථය තේරුම් ගැනීම අවශ්‍ය වේ. අප කිසියම් සැපක් හෝ දුකක් විඳීමේ දී සිදුවන්නේ බාහිර අරමුණු වෙත අවිද්‍යා සහගතව බැලීම හේතුවෙන් තෘෂ්ණා, දෘෂ්ටි, මානාදි කෙලෙස් හටගැනීම නිසයි. රූප, ශබ්දාදි කිසියම් අරමුණුක් ඇස, කන ආදි ඉන්ද්‍රිය වෙත සම්බන්ධ වීමේ දී බාහිර සතර මහාභූතයෙන් නිර්මාණය වූ දෑ අරබයා තම මානසික ස්වභාවය අනුව ප්‍රපංච ගොඩනැගේ. කිසියම් අරමුණක් වෙත අවිද්‍යා සහගතව බැලුව හොත් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචුපාදානස්කන්ධය ගොඩ නැගෙන අතර එලෙස

